# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2261/51 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් 29 වන දින
කොළඹ දී ය.

**නියෝග**

1\. (1) මේ නියෝග 2021 අංක 3 දරන වෙළඳ නැව් (ඉදිකිරීම - ගින්නෙන් ආරක්ෂාව, ගිනි හඳුනා ගැනීම සහ ගිනි නිවීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ II - 2 වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගයන්හි කාර්යය විය යුතු ය.

1A - G 35890 — 510 (2022/01)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 වන කොටස

**මේ නියෝගවල අදාළත්වය**

2. (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන, (4) වන, (5) වන සහ (6) වන අනු නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති ජාත්‍යන්තර මුහුදු ගමන්වල යෙදෙන නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන වෙනත් යම් විදේශීය නැව්වලට අදාළ විය යුතු ය.

(2) (මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1988 ප්‍රොටොකෝලයයේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගඃ-

(අ) යුධ නැව් සහ හමුදා පිරිස් ගෙන යන නැව් සඳහා;

(ආ) දළ ටොන් බර 500 ට අඩු භාණ්ඩ නැව් සඳහා;

(ඇ) යාන්ත්‍රික ක්‍රමවලින් ප්‍රචලනය නොකරන නැව් සඳහා;

(ඈ) ප්‍රාථමික ලෙස ඉදිකරන ලද දැවමය නැව් සඳහා;

(ඉ) වෙළඳාමේ නොයෙදෙන විනෝද යාත්‍රා සඳහා; සහ

(ඊ) ධීවර යාත්‍රා සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝග 2012 ජූලි මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකරන ලද නැව්වලට අදාළ විය යුතු ය.

(4) සම්මුතියේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 2012 ජූලි මස 1 වන දිනට පෙර ඉදිකරන ලද නැව්, සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ 1(2) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි නියෝගයන්ට අනුකූල විය යුතු ය.

(5) සම්මුතියේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, "ටැංකර නෞකා" වලට අදාළ නියමයන්, සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ 1 (6) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට යටත්ව ටැංකර නෞකාවලට අදාළ විය යුතු ය.

(6) සම්මුතියේ V වන පරිච්ඡේදයේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගවල විධිවිධාන, උතුරු ඇමරිකාවේ මහා විල්වල සහ කැප් ඩෙස් රොසියර්ස් සිට ඇන්ටිකොස්ටි දූපතේ බටහිර තුඩුව දක්වා අඳිනු ලබන සෘජු රේඛාවක නැගෙනහිරට වන්නට පිහිටි ශාන්ත ලෝරන්ස් ගංගාව හරහා 63 වන දේශාංශකයේ ඇන්ටිකොස්ටි දූපතේ උතුරු ප්‍රදේශයේ තනිව යාත්‍රා කරන ශ්‍රී ලාංකික නැව්වලට අදාළ නොවිය යුතු ය.

3. (1) අලුත්වැඩියාවන්, වෙනස් කිරීම්, නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවි කිරීමක් සඳහා භාජනය වන සියලු නැව්, අවම වශයෙන්, මේ නැව්වලට කලින් අදාළ වූ නියමයන්ට අනුකූල වීම අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතු ය. එම නැව්, 2012 ජූලි මස 01 වන දිනට පෙර ඉදිකරන ලද නැව් සඳහා වන නියමයන්ට අවම වශයෙන් එම නැව්, එවැනි අලුත්වැඩියාවන්, වෙනස් කිරීම්, නවීකරණයන් හෝ උපකරණ සවිකිරීම් සිදු කරනු ලැබීමට පෙර අනුකූල වූ ප්‍රමාණයට ම අනුකූල විය යුතු ය.

(2) සැලකිය යුතු ලෙස නැවක මිනුම් හෝ මගීන්ගේ නවාතැන් සඳහා වන ඉඩකඩ වෙනස් කරන හෝ, නැවක සේවා කාලය සැලකිය යුතු ලෙස වැඩි කරන අලුත්වැඩියාවන් වෙනස් කිරීම් සහ නවීකරණයන් සහ එයට අදාළ උපකරණ සැපයීම් මගින් (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යුක්ති සහගත සහ ප්‍රායෝගික වන්නේ යයි සලකනු ලබන තාක් දුරට 2012 ජූලි මස 1 වන දින හෝ ඊට පසු ඉදිකරන ලද නැව් සඳහා වන නියමයන් සපුරාලිය යුතු ය.

4. (1) සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නොයෙදෙන, එහෙත්, විශේෂ අවස්ථානුගත කරුණුවල දී, තනි ජාත්‍යන්තර ගමනක යෙදීම සඳහා නියම කරනු ලබන නැවක්, වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝගවල යම් නියම-යන්වලින් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව නැව විසින් සිදු කරනු ලැබිය යුතු මුහුදු ගමන් සඳහා ප්‍රමාණවත් වන ආරක්ෂක නියමයන්ට එකී නැව අනුකූල විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ජාත්‍යන්තර මුහුදු ගමන්හි යෙදෙන නැව්වල යම් නවීන අංග වැඩිදියුණු කිරීම සම්බන්ධ-පර්යේෂණ සහ නැවක එම අංග අන්තර්ගත කිරීම පිළිබඳ පර්යේෂණවලට බරපතළ බාධාවක් විය හැකි ලෙස අදාළ වන සම්මුතියේ I - 1 වන, II - 2 වන, III - 3 වන සහ IV - 4 වන පරිච්ඡේදවල යම් විධිවිධානවලින් නවීන වර්ගයක අංග අන්තර්ගත වන යම් නැවක් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එවැනි නැව්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව නැව මගින් ලබාදීමට අපේක්ෂිත සේවාව ලබා දීම සඳහා ප්‍රමාණවත් වන සහ නැවේ සම්පූර්ණ ආරක්ෂාව පිළිබඳ සහතික කිරීම සඳහා වන සහ නැව ගමන් කරනු ලබන රාජ්‍යයන්හි රජයන් විසින් පිළිගනු ලබන ආරක්ෂක නියමයන්ට, කවර හෝ ආකාරයකින්, අනුකූල විය යුතු ය.

(3) මුහුදු ගමනේ ආරක්ෂිත ස්වභාවය සහ තත්ත්වය, සම්මුතියේ I - 2 වන පරිච්ඡේදයේ වන යම් විශේෂිත නියමයන් අදාළ කර ගැනීම අයුක්ති සහගත හෝ අනවශ්‍ය බවට පත් කරන පරිද්දෙන් වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම්, ඔහු විසින් එම නැව්වල මුහුදු ගමන සිදුවන අතරතුර දී ඊට ආසන්න ම භූමියේ සිට සැතපුම් 20 ට වැඩි දුරින් ගමන් නොකරන තනි ශ්‍රී ලාංකික නැව් හෝ ශ්‍රී ලංකා නැව් පන්ති, එම නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(4) එවැනි නිදහස් කිරීමක් සඳහා අවසර ලබාදෙන්නා වූ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (මේ නියෝගවල "සංවිධානය" යනුවෙ-න් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය වෙත එකී නිදහස් කිරීම පිළිබඳ විස්තර සහ ඒ සඳහා වන හේතු දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ නියෝගයේ සඳහන් කරන ලද නිදහස් කිරීම් 2022.01.06 දිනැති අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවලට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ නිශ්චිතව දක්වා ඇති විකල්ප නියමයන් සමග යම් නැවක් අනුකූල වන විට දී හෝ යම් විධිවිධාන අයුක්ති සහගත හෝ ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එහි විස්තර කර ඇති ආකාරයේ නැවක් සම්බන්ධයෙන් සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ අදාළ නියමයන් අත්හරිනු ලැබිය හැකි ය.

(7) සම්මුතියේ II - 2 වන පරිච්ඡේදය මගින් නියම කරනු ලබන යම් අනුමතයක් හෝ ආදර්ශ අනුමැතියක් හෝ සම්මුතියේ II - 2 වන පරිච්ඡේදය මගින් අවසර ලබා දෙන ලද ඊට සමාන සැලසුමක් හෝ අත්හැරීමක් -

(අ) එය ලිඛිතව ඇත්නම්;

(ආ) එය බලාත්මක වන දිනය එහි නිශ්චිතව දක්වා ඇතිනම්; සහ

(ඇ) එහි සඳහන් යම් කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇත්නම්,

පමණක් වලංගු විය යුතු ය.

(8) මේ නියෝග යටතේ ප්‍රදානය කරනු ලබන යම් නිදහස් කිරීමක්, අනුමැතියක් හෝ අත්හැරීමක් සාධාරණ දැනුම් දීමක් කිරීමෙන් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

5. වන්දනාකරුවන් සඳහා වන ව්‍යාපාර වැනි මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා වූ විශේෂ ව්‍යාපාරයන් හි යොදවන ලද මගී නැව් සම්බන්ධයෙන් වන විට දී, එකී නැව් සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, එකී නැව්:

(i) 1971, විශේෂ ව්‍යාපාර මගී නැව් ගිවිසුමට අමුණා ඇති රීති; සහ

(ii) 1973, විශේෂ ව්‍යාපාර මගී නැව් සඳහා වන ඉඩ පහසුකම් අවශ්‍යතා පිළිබඳ ප්‍රොටො-කෝලයට අමුණා ඇති රීති;

යන විධිවිධාන සමග සම්පූර්ණයෙන් අනුකූල වන්නේ නම්, එම නැව් එම නියමයන්වලින් නිදහස් කරනු ලැබිය හැකි ය.

II වන කොටස

**ගින්නෙන් ආරක්ෂාව, ගිනි හඳුනා ගැනීම සහ ගිනි නිවීම**

6. මේ නියෝග අදාළ වන යම් නැවක්, සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ "ආ", "ඇ", "ඈ" සහ "උ" යන කොටස්වල නිශ්චිතව දක්වා ඇති, එහි විස්තර කර ඇති නැවක් සම්බන්ධයෙන් වන ගින්නෙන් ආරක්ෂාව, ගිනි හඳුනා ගැනීම සහ ගිනි නිවීම පිළිබඳ නියමයන්වලට, අනුකූල විය යුතු ය.

7. (1) ගිනි ආරක්ෂණ සැලැස්ම සහ වැඩ පිළිවෙළ මගින් සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාර්යබද්ධ නියමයන් සපුරාලන විටක දී, එම සැලැස්ම සහ වැඩපිළිවෙළ සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ "ආ", "ඇ", "ඈ" සහ "ඉ" හෝ "උ" යන කොටස්වල දක්වා ඇති නිර්දේශාත්මක නියමයන්ගෙන් වෙනස් විය හැකි ය.

(2) ගිනි ආරක්ෂණ සැලැස්ම හෝ වැඩ පිළිවෙළ සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ නිර්දේශාත්මක නියමයන්ගෙන් වෙනස් වන අවස්ථාවක දී, විකල්ප සැලස්මේ හෝ වැඩපිළිවෙලවල ඉන්ජිනේරු විශ්ලේෂණය, ඇගයීම සහ අනුමත කිරීම සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ "ඊ" කොටස සමග අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විකල්ප සැලැස්ම සහ වැඩ පිළිවෙළවල් සම්බන්ධයෙන් වන අදාළ තොරතුරු, සියලු ගිවිසුම්කාර රාජ්‍යයන් වෙත ප්‍රචාරය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සංවිධානය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

III වන කොටස

**මෙහෙයුම් නියමයන්**

8. (1) නැව වෙත ලබා දී ඇති ගිනි ආරක්ෂණ පියවරවල ඵලදායිතාව පවත්වා ගෙන යාම සහ අධීක්ෂණය කිරීම මේ නියෝගයේ කාර්යය වේ. මෙම කාර්යය සඳහා, පහත දැක්වෙන කාර්යබද්ධ නියමයන් සපුරාලිය යුතු යː

(අ) ගිනි ආරක්ෂණ පද්ධති සහ ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ භාවිතය සඳහා සූදානම්ව පවත්වාගෙන යා යුතු ය; සහ

(ආ) ගිනි ආරක්ෂණ පද්ධති සහ ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ නිසි පරිදි පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) නැවක් සේවයේ යෙදෙන අතරතුර සියලු අවස්ථාවන් හි දී, එම නැව විසින් 1(අ) වන අනු නියෝගයේ නියමයන්ට අනුකූල විය යුතු ය. නැවක්ː

(අ) (නැංගුරම්ලා හෝ වරායේ හෝ) අලුත්වැඩියා කටයුතු සඳහා හෝ නවතා ඇති හෝ නැව් තටාකයේ ඇති අවස්ථාවක දී;

(ආ) එහි අයිතිකරු හෝ අයිතිකරුගේ නියෝජිතයා විසින් එය සේවයේ නොයෙදෙන බවට ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී; සහ

(ඇ) මගී නැව් සම්බන්ධයෙන් වන විට දී, නෞකාස්ථව කිසිදු මගියෙකු නොමැති අවස්ථාවක දී,

එය සේවය නොකරනු ලැබේ.

(3) ගින්නක් හටගන්නේ නම්, පහත දැක්වෙන ගින්නේ ආරක්ෂා වීමේ පද්ධතිවල නියමිත ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා නිසි ක්‍රමයකට තබා ගත යුතු යː

(අ) ගිනි- ප්‍රතිරෝධක අංග ඇතුළුව ව්‍යුහාත්මක ගිනි ආරක්ෂාව සහ මෙම අංගවල ඇති හිඩැස් සහ විනිවිද යැම්වල ආරක්ෂාව;

(ආ) ගිනි හඳුනා ගැනීම සහ ගිනි පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති; සහ

(ඇ) බේරී යාමේ ක්‍රම සහ උපකරණ,

(4) ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ හොඳ වැඩ කරන තත්ත්වයෙන් සහ වහාම භාවිතා කළ හැකි පරිදි සූදානම්ව තබා ගත යුතු ය. භාවිතා කරන ලද එහා මෙහා ගෙන යා හැකි ගිනි නිවනයන් වහාම නැවත පිරවීම හෝ සමාන ඒකකයක් ඒ වෙනුවට ආදේශ කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

9. (1) නඩත්තුව, පරීක්ෂාව සහ පරීක්ෂණ පැවැත්වීම, සංවිධානය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සහ ගිනි නිවීමේ පද්ධති සහ උපකරණවල විශ්වසනීය බව තහවුරු කිරීම පිළිබඳ සළකා බලන ආකාරයකින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) නඩත්තුව සැලැස්ම නැවෙහි තබනු ලැබිය යුතු අතර අධ්‍යක්ෂ-ජනරාල්වරයාට අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී එය පරීක්ෂා කිරීම සඳහා තිබිය යුතු ය.

(3) නඩත්තු සැලැස්ම පිහිටුවනු ලබන අවස්ථාවක දී, එයට යටත් පිරිසෙයින් පහත දැක්වෙන ගිනි ආරක්ෂණ පද්ධති සහ ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ ඇතුළත් විය යුතු ය.

(අ) ගිනි නිවීමට යොදාගන්නා දිග බට, නොසල් සහ ජාත්‍යන්තර වෙරළ සම්බන්ධක ඇතුළු ප්‍රධාන ගිනි නිවීමේ පරිපථ (fire mains), ගිනි නිවීමේ පොම්ප (fire pumps), සහ ප්‍රධාන ජල නළයෙන් ජලය ඇද ගැනීමට ඇති වීදි නළ (hydrants);

(ආ) ස්ථාවර ගිනි හඳුනාගැනීමේ පද්ධති සහ වෙනත් ගිනි නිවීමේ උපකරණ;

(ඇ) ස්ථාවර ගිනි නිවීමේ පද්ධති සහ වෙනත් ගිනි නිවීමේ උපකරණ;

(ඈ) ස්වයංක්‍රීය ජල ඉසිනය, ගිනි හඳුනා ගැනීමේ සහ ගිනි පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති;

(ඉ) ගිනි සහ දුම් පරිමන්දක, පංකා සහ ඒවා හැසිරවීම ඇතුළු වායු සංසරණ පද්ධති;

(ඊ) හදිසි අවස්ථාවක දී ඉන්ධන සැපයුම නවතා දැමීම;

(උ) ගිනි ආරක්ෂක දොරටු සහ ඒවායෙහි හැසිරවීම;

(ඌ) සාමාන්‍ය හදිසි තත්ත්වයන් පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති;

(එ) හදිසි අවස්ථාවක දී දූෂිත පරිසරයෙන් මිදී හුස්ම ගැනීම සඳහා වන උපකරණ;

(ඒ) (space chargers)ඇතුළු එහා මෙහා ගෙන යා හැකි ගිනි නිවනයන්; සහ

(ඔ) ගිනි නිවන භටයින්ගේ ඇඳුම් කට්ටල.

(4) නඩත්තු කිරීමේ වැඩසටහන පරිඝනක පාදක විය හැකි ය.

10\. (1) 9(3) වන නියෝගයේ ලැයිස්තුගත කර ඇති ගිනි ආරක්ෂණ පද්ධති සහ උපකරණවලට අමතරව, මගීන් 36 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහනය කරන නැව් විසින් අඩු ස්ථානීය ආලෝකකරණ සහ පොදු ආමන්ත්‍රණ පද්ධතියක් සඳහා නඩත්තු සැලැස්මක් සකස් කළ යුතු ය.

(2) 9(3) වන නියෝගයේ ලැයිස්තුගත කර ඇති ගිනි ආරක්ෂණ පද්ධති සහ උපකරණවලට අමතරව, ටැංකර විසින්:

(අ) නිෂ්ක්‍රීය වායු පද්ධති;

(ආ) නැව් තට්ටුවලට පෙණ විදින පද්ධති (deck foam systems);

(ඇ) (cargo pump rooms)වල ඇති ගිනි ආරක්ෂණ වැඩපිළිවෙළ; සහ

(ඈ) ගිනි ඇවිලෙන සුළු වායු හඳුනාගන්නා උපකරණ,

සඳහා නඩත්තු සැලැස්මක් සකස් කළ යුතු ය.

11\. (1) නැවක නෞකාස්ථ නාවික සාමාජිකයන් වෙත නැවේ ගිනි ආරක්ෂණය පිළිබඳ සහ ඔවුන්ට පවරා ඇති කාර්යයන් පිළිබඳ උපදෙස් දෙනු ලැබිය යුතු ය. ගිනි නිවීම සඳහා වගකිව යුතු පාර්ශවයන් සංවිධානගත විය යුතු ය. මෙම පාර්ශවයන්ට, නැව සේවයේ යෙදී සිටින අතරතුර සියලු වේලාවන්හි දී තම කාර්යයන් සම්පූර්ණ කිරීමේ හැකියාව තිබිය යුතු ය.

(2) නාවික පිරිස, නැවේ වැඩ පිළිවෙළ මෙන්ම ඔවුන් විසින් භාවිතා කිරීමට සිදුවන යම් ගිනි නිවීමේ පද්ධති සහ උපකරණවල පිහිටි ස්ථාන සහ ක්‍රියාකාරීත්වය සමග හුරුපුරුදු බවක් ඇති කිරීම සඳහා පුහුණු කරනු ලැබිය යුතු ය. හදිසි අවස්ථාවල දී දූෂිත පරිසරයෙන් මිදී හුස්ම ගැනීම සඳහා වන උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව නෞකාස්ථ පුහුණුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ගිනි නිවීමේ කාර්යයන් පවරා ඇති නාවික පිරිසෙහි කාර්ය සාධනයේ වැඩි දියුණු කළ යුතු අංශ හඳුනා ගැනීම, පවත්වාගෙන යනු ලබන ගිනි නිවීමේ කුසලතාවල නිපුනත්වය තහවුරු කිරීම සහ ගිනි නිවීම සඳහා සංවිධානය වීමේ සූදානම් සහිත බව තහවුරු කිරීම සඳහා නෞකාස්ථ පුහුණු සහ අභ්‍යාස පැවැත්වීම මගින් එම නාවික පිරිසේ කාර්ය සාධනය අගයනු ලැබිය යුතු ය.

(4) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 19.4.1 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නැවේ ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ භාවිතය පිළිබඳ නෞකාස්ථ පුහුණුව සැලසුම් කර මෙහෙයවනු ලැබිය යුතු ය.

(5) ගිනි අභ්‍යාස සම්මුතියේ III වන පරිච්ඡේදයේ 19.3 වන නියෝගයේ 19.5 වන නියෝගයේ විධිවිධාවලට අනුකූලව මෙහෙයවා වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) අභ්‍යාසවල දී භාවිතා කරන හුස්ම ගැනීමේ උපකරණ සිලින්ඩර නැවත පිරවීමේ නෞකාස්ථ ක්‍රමයක් සපයනු ලැබිය යුතු ය; හෝ එම භාවිත කරන ලද සිලින්ඩර සුදුසු ප්‍රමාණයක් නැවෙහි රැගෙන යනු ලැබිය යුතු ය.

12. (1) ඉංග්‍රීසි භාෂාවෙන් ලියවුණු පුහුණු අත්පොතක් එක් එක් නාවික පිරිස් භෝජන ශාලාවෙහි වෙත සහ ක්‍රීඩා ශාලාව වෙත හෝ එක් එක් නාවික කුටි වෙත සපයනු ලැබිය යුතු ය.

(2) වෙලුම් කිහිපයකින් සමන්විත විය හැකි පුහුණු අත්පොතෙහි, (3) වන උපනියෝගයේ නියම කර ඇති උපදෙස් සහ තොරතුරු පහසුවෙන් වටහාගත හැකි පදවලින් සහ හැකි අවස්ථාවල දී රූප සටහන් සහිතව ඇතුළත් විය යුතු ය. එම තොරතුරුවල යම් කොටසක් අත්පොත වෙනුවට ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකාරක ආධාරයෙන් සපයනු ලැබිය හැකි ය.

(3) පුහුණු අත්පොත මගින් පහත දැක්වෙන දෑ විස්තරාත්මකව පැහැදිලි කළ යුතු යː

(අ) දුම්පානය කිරීමේ අනතුරුදායක තත්ත්වයන්, විද්‍යුත් උපද්‍රව, ගිනි ඇවිලෙන සුළු ද්‍රව සහ නැවේ ඇති විය හැකි ඒ හා සමාන උපද්‍රව හා සම්බන්ධ සාමාන්‍ය ගිනි ආරක්ෂණ ක්‍රියාමාර්ග සහ පූර්වාරක්ෂක;

(ආ) ගිනි නිවීමේ ක්‍රියාමාර්ග සහ ගින්නක් පිළිබඳ නිවේදනය සහ අතින් ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථාන භාවිතය සඳහා වන කාර්ය පටිපාටි ඇතුළු ගිනි නිවීමේ කාර්ය පටිපාටි පිළිබඳ සාමාන්‍ය උපදෙස්;

(ඇ) නැවේ අනතුරු ඇඟවීමේ සංඥාවල අර්ථයන්;

(ඈ) ගිනි නිවීමේ පද්ධති සහ උපකරණ ක්‍රියාත්මක කිරීම සහ භාවිතය;

(ඉ) ගින්නක දී පිටවන දොරටු ක්‍රියාත්මක කිරීම සහ භාවිතය;

(ඊ) ගිනි සහ දුම් පරිමන්දක ක්‍රියාත්මක කිරීම සහ භාවිතය; සහ

(උ) බේරී යාමේ පද්ධති සහ උපකරණ.

(4) පාලන ස්ථාන, "A" පන්තියේ කලාප මගින් ආවරණය වන විවිධ ගිනි ඇතිවීමේ අංශ, "B" පන්තියේ කලාප මගින් ආවරණය වන විවිධ ගිනි ඇතිවීමේ අංශ සමග ගිනි හඳුනා ගැනීමේ සහ ගිනි පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති, වතුර ඉසිනය සවි කිරීම, ගිනි නිවීමේ උපකරණ, විවිධ මැදිරි, තට්ටු ආදිය වෙත ප්‍රවේශ වීමේ මාර්ග පිළිබඳ විස්තර සහ පංකා පාලනය කරන ස්ථාන, පරිමන්දක පිහිටන ස්ථාන සහ එක් එක් අංශය සඳහා වන සංවාතන පංකාවල හඳුනා ගැනීමේ අංක පිළිබඳ විස්තර ඇතුළු සංවාතන පද්ධති පිළිබඳ විස්තර,එක් එක් තට්ටුව සඳහා පැහැදිලිව දක්වමින් නැවේ නිලධරයන්ට මග පෙන්වීම් සඳහා සාමාන්‍ය වැඩපිළිවෙළ සැලසුම් ස්ථිරව ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය. එසේ නැතහොත්, ඉහත සඳහන් කරන ලද තොරතුරු කුඩා පොතක දැක්විය හැකි ය. එහි පිටපතක් එක් එක් නිලධරයා වෙත සපයනු ලැබිය යුතු අතර එක් පිටපතක් සෑම විටම එයට ප්‍රවේශ විය හැකි ස්ථානයක තැබිය යුතු ය. සැලසුම් සහ කුඩා පොත් යාවත්කාලීනව තැබිය යුතු ය; ඒවායෙහි සිදු වන යම් වෙනස් කිරීම් ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින් වාර්තා කරනු ලැබිය යුතු ය. එම සැලසුම් සහ කුඩා පොත්වල විස්තර ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.

(5) ගිනි පාලන සැලසුම්වල අනුපිටපත් කට්ටලයක් හෝ සැලසුම් අන්තර්ගත වන කුඩා පොතක්, වෙරළබඩ ගිනි නිවීමේ භට පිරිස්වල සහාය සඳහා නැව් තට්ටුවෙන් පිටත කැපී පෙනෙන ලෙස සලකුණු කරන ලද ජල පරිරෝධක ආවෘත ස්ථානයක ස්ථිරවම ගබඩා කර තබනු ලැබිය යුතු ය.

13. (1) 11(3) වන නියෝගයේ නියමයන්ට අමතරව, මගීන් වෙත නිවේදනය කිරීම සහ මගීන් රැස්වීමේ ස්ථානවලට සහ නැව් නැගීමේ තට්ටුවලට ගමන් කිරීම පිළිබඳ සළකා බලමින්, සම්මුතියේ III වන පරිච්ඡේදයේ 30 වන නියෝගයේ විධිවිධානවල අනුකූලව ගිනි අභ්‍යාස මෙහෙයවනු ලැබිය යුතු ය.

(2) මගීන් 36 දෙනෙකුට වඩා ප්‍රවාහනය කරන නැව්වල, මේ නියෝග මගින් නියම කරනු ලබන සැලසුම් සහ කුඩා පොත් මගින්, සංවිධානය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම් ව ගින්නෙන් ආරක්ෂාව, ගිනි හඳුනාගැනීම සහ ගිනි නිවීමට අදාළ තොරතුරු සැපයිය යුතු ය.

14. (1) ගිනි ආරක්ෂණයට අදාළව නිසි පරිදි නැව් සහ නැව් භාණ්ඩ හැසිරවීමේ ක්‍රියාවලි සඳහා තොරතුරු සහ උපදෙස් ලබා දීමේ කාර්යය සඳහා, සෑම නැවක ම ගිනි ආරක්ෂණ මෙහෙයුම් පිළිබඳ කුඩා පොතක් නෞකාස්ථව තිබිය යුතු ය.

(2) ඉහත (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද ගිනි ආරක්ෂණ මෙහෙයුම් පිළිබඳ කුඩා පොතෙහි, භාණ්ඩ පැටවීම සහ බෑම අතරතුර දී සහ ගමන් ගන්නා අතරතුර දී නැවේ සාමාන්‍ය ගිනි ආරක්ෂණය සඳහා නාවික පිරිසෙහි වගකීම් සලකා බලමින් තොරතුරු ඇතුළත් විය යුතු ය. සාමාන්‍ය භාණ්ඩ හැසිරවීම සඳහා වන අත්‍යාවශ්‍ය ගිනි ආරක්ෂණ පූර්වාරක්ෂක පිළිබඳ පැහැදිලි කරනු ලැබිය යුතු ය. අන්තරායකර භාණ්ඩ සහ ගිනිගන්නා සුළු තොග භාණ්ඩ ප්‍රවාහනය කරන නැව් සඳහා, ගිනි ආරක්ෂණ මෙහෙයුම් අත්පොතෙහි, උචිත පරිදි ජාත්‍යන්තර සමුද්‍රීය ඝන තොග භාණ්ඩ සංග්‍රහයේ, ජාත්‍යන්තර තොග රසායනික සංග්‍රහයේ, ජාත්‍යන්තර වායු ප්‍රවාහක සංග්‍රහයේ සහ ජාත්‍යන්තර සමුද්‍රීය අන්තරාකර භාණ්ඩ සංග්‍රහයේ අන්තර්ගත වන උචිත ගිනි නිවීමේ සහ හදිසි අවස්ථා භාණ්ඩ හැසිරවීමේ උපදෙස් සඳහා යොමුවක් ද සැපයිය යුතු ය.

(3) (1) වන උප නියෝගයේ සඳහන් කරන ලද ගිනි ආරක්ෂණ මෙහෙයුම් පිළිබඳ කුඩා පොත එක් එක් නාවික පිරිස් භෝජන ශාලාව වෙත සහ ක්‍රීඩා ශාලාව වෙත හෝ එක් එක් නාවික පිරිස් කුටිය වෙත සපයනු ලැබිය යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් ලිඛිතව තිබිය යුතු ය.

(4) (1) වන උප නියෝගයේ සඳහන් කරන ලද ගිනි ආරක්ෂණ මෙහෙයුම් පිළිබඳ කුඩා පොත 12 වන නියෝගයේ නියම කරන ලද පුහුණු අත්පොත් සමග සංයුක්ත විය හැකි ය.

15. (1) ටැංකර යාත්‍රාවල, 14 වන නියෝගයේ සඳහන් කරන ලද ගිනි ආරක්ෂණ මෙහෙයුම් පිළිබඳ කුඩා පොතෙහි, සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ 16 වන නියෝගයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ගිනිගන්නා සුළු වාෂ්ප ජ්වලනය වීම හේතුවෙන්

භාණ්ඩ සහිත ප්‍රදේශ වෙත ගින්න පැතිරවීම වැළැක්වීම සඳහා වන විධිවිධාන සහ භාණ්ඩ ටැංකර වායු රේචනය සහ/හෝ වායු නිදහස් කිරීම පිළිබඳ කාර්ය පටිපාටි ඇතුළත් විය යුතු ය.

(2) ටැංකර නෞකාවල නිෂ්ක්‍රීය වායු පද්ධති මෙහෙයවීම සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ 16 වන නියෝගය සමඟ අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

IV වන කොටස

**සාමාන්‍ය විධිවිධාන**

16. පරිපාලනය සෑහීමට පත්වීම සඳහා සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ සඳහන් කිරීම සිදු කර ඇති සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් හරහා එකී සඳහන් කිරීම සඳහා ඍජු අර්ථකතන සපයා නොමැති අවස්ථා සම්බන්ධයෙන් වන විට දී, වර්ගීකරණ සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ ඒකීය අර්ථ නිරූපණ, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අර්ථ නිරූපණය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

17. පිළිගත් සංවිධානයක් (RO) විසින් හෝ එක්සත් ජනපද වෙරළාරක්ෂක, එක්සත් රාජධානියේ සමුද්‍රීය වෙරළාරක්ෂක නියෝජ්‍යායතනය හෝ ජපානයේ සමුද්‍රීය පරිපාලනය විසින් ප්‍රදානය කරන ලද උපකරණ අනුමතයන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලබන අතර, අනුමතයන් සම්මුතියේ නියමයන් සමඟ සම්පූර්ණයෙන් ම අනුකූල වන බව දක්වනු ලැබේ. තව ද අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යුරෝපීය සංගම් සමුද්‍ර උපකරණ විධිවිධානවල සහතික කිරීමේ කාර්ය පටිපාටිය යටතේ අනුමත කරනු ලැබ ඇති උපකරණ ද පිළිගනු ලබයි.

18. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍රසූත්‍රවල දෝෂ සහගත තත්ත්වයන් සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා ගනු ලැබිය හැකි ය.

19. සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එවැනි පාදක සටහන්වල සඳහන් කරනු ලබන යෝජනා සම්මතයන්, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගවල කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

20. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධාන අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

21. මේ නියෝගවල -

"A" පන්තියේ කලාප" යන්නෙන්, පහත දැක්වෙන නිර්ණායක සමඟ අනුකූල වී ඇති කලාප අදහස් වේ;

1. ඒවා වානේ හෝ වෙනත් ඒ හා සමාන ද්‍රව්‍යයකින් ඉදිකරනු ලබයි.
2. ඒවා සුදුසු පරිදි දැඩි කරනු ලබයි.
3. ඒවා, පහත දැක්වෙන කාලසීමාවන් ඇතුළත, විවෘත නොවූ පැත්තේ සාමාන්‍ය උෂ්ණත්වය ආරම්භක උෂ්ණත්වයේ සිට ඉහළ $140^0C$ ට වඩා ඉහළ අගයකට වැඩි නොවන පරිදි හෝ යම් සන්ධියක් ඇතුළුව

යම් ලක්ෂ්‍යයක උෂ්ණත්වය ආරම්භක උෂ්ණත්වයේ සිට $180^0C$ ට වඩා ඉහළ අගයකට වැඩි නොවන පරිදි අනුමත දහනය නොවන ද්‍රව්‍යයකින් පරිවරණය කරනු ලබයි:

"A - 60" පන්තිය මිනිත්තු 60

"A - 30" පන්තිය මිනිත්තු 30

"A - 15" පන්තිය මිනිත්තු 15

"A - 0" පන්තිය මිනිත්තු 0;

" "B" පන්තියේ කලාප" යන්නෙන්, පහත දැක්වෙන නිර්ණායක සමඟ අනුකූල වන්නා වූ නැවේ කාමර බෙදුම්, නැව් තට්ටු, සිවිලිම් හෝ ආස්තරණවලින් සකස් වී ඇති කලාප අදහස් වේ:

1. ඒවා අනුමත නොවන ද්‍රව්‍යවලින් ඉදිකරනු ලබන අතර ඉදිකිරීම සඳහා සහ "B" පන්තියේ කලාප ගොඩ නැගීම සඳහා භාවිත කරන සියලු ද්‍රව්‍ය දහනය නොවන ද්‍රව්‍ය වේ, නමුත් සම්මුතියේ II - 2 වන පරිච්ඡේදයේ වෙනත් උචිත නියමයන් සපුරාලන බැවින් දහනය වන තුනී ලී තහඩු සඳහා අවසර දෙනු ලැබිය හැකි ය;

2. ඒවාට, පහත දැක්වෙන කාලසීමාවන් ඇතුළත, විවෘත නොවූ පැත්තේ සාමාන්‍ය උෂ්ණත්වය ආරම්භක උෂ්ණත්වයේ සිට $140^0C$ ට වඩා ඉහළ අගයකට වැඩි නොවන පරිදි හෝ යම් සන්ධියක් ඇතුළුව යම් ලක්ෂ්‍යයක උෂ්ණත්වය ආරම්භක උෂ්ණත්වයේ සිට 225 $^0C$ ට ඉහළ අගයකට වැඩි නොවන පරිදි පරිවාරක අගයක් පවතී;

"B - 15" පන්තිය මිනිත්තු 15

"B - 0" පන්තිය මිනිත්තු 0

3. ඒවා, සම්මත ගිනි පරීක්ෂාවේ පළමු පැය භාගය අවසානය දක්වා ගිනි දැල්වීමට හැකිවන පරිදි ඉදි කරනු ලබයි; සහ

4. එය, ඍජු බව සහ උෂ්ණත්වය ඉහළ යාම සඳහා වන ඉහත අවශ්‍යතාවයන් සපුරාලන බවට තහවුරු කිරීම සඳහා, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ගිනි පරීක්ෂා කාර්ය පටිපාටි සංග්‍රහය සමඟ අනුකූලව මූලාකෘතික කලාපයක පරීක්ෂාවක් නියම කරනු ලබයි;

"භාණ්ඩ නැව" යන්නෙන්, මගී නැවක් නොවන යම් නැවක් අදහස් වේ;

"සම්මුතිය" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, කලින් කල සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව කරනු ලබන සංශෝධන අදහස් වේ;

"සංවිධානය'' යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"මගී නැව" යන්නෙන්, මගීන් දොළොස් දෙනෙකුට වැඩි ප්‍රමාණයක් ගෙන යන නැවක් අදහස් වේ;

"පිළිගත් සංවිධානය'' යන්නෙන්, සංවිධානය විසින් සම්මත කරන ලද "පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ" විධිවිධානයන්ට අනුකූලව පිළිගෙන ඇති සංවිධානයක් අදහස් වේ;

"ටැංකර නෞකාව" යන්නෙන්, ගිනිගන්නා සුළු ස්වභාවයකින් යුත් ද්‍රව නැව් භාණ්ඩ තොග වශයෙන් ගෙන යාම සඳහා ඉදිකරන ලද හෝ භාවිතා කරනු ලබන නැව අදහස් වේ;

"ජල පරිරෝධකභාවය" යන්නෙන්, නිරූපිත සහ හානියට පත් තත්ත්වයන් තුළ දී ඇති වීමට ඉඩ ඇති ජල ශීර්ෂයන් යටතේ යම් දිශාවකින් ජලය ගලා ඒම වැළැක්වීමේ හැකියාව සහිත ව්‍යුහයක කොටස් සඳහා සම්මත මාන සහ සැලසුම් තිබීම අදහස් වේ. හානියට පත් තත්ත්වයක දී, ජල ගැලීමේ අතරමැදි අවස්ථා ඇතුළුව, ජල ශීර්ෂය සමතුලිතතාවයේ දරුණුතම අවස්ථාවට පත්ව ඇති ලෙස සලකනු ලැබිය යුතු ය;

"කාළගුණ පරිරෝධකභාවය" යන්නෙන්, කිසිදු මුහුදු තත්ත්වයක දී ජලය නැව තුළට ඇතුළු නොවන බව අදහස් වේ;

EOG 01 - 0243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.